*සැ. යු.* - 2021.12.10 දින පළවූ අංක 2258 දින *ගැසට්* පත්‍රයේ IV (අ) වැනි කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,259 - 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.12.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1698 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන | 1699 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 1703 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1722 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජනවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1697 – B 082297— 403 (2021/12)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2021 අංක 1211

MOD/DEF/HRM/01/R/COM/DE/21 (01)

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම සඳහන් විශේෂඥ වෛද්‍ය නිලධාරි 2018.09.27 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවේ ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/86160 ලුතිනන් කර්නල් මාන්නමරක්කලගේ ඒඩ්රියන් මයිකල් සොහාන් කුරේ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 29 වැනි දින.
කොළඹ දී ය.

12-483/1

---

2021 අංක 1212

MOD/DEF/HRM/01/R/IRT/21 (01)

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අන්තර් රෙජිමේන්තු මාරු කිරීමක්

පහත නම් සඳහන් නිලධාරින් 2021.01.07 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය වෙතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකාර්මික හා පශුසම්පත් බළකාය වෙත මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කර්නල් කිත්සෙන් සුධීර තලගල (නි/66103)
මේජර් දිසානායක මුදියන්සේලාගේ හේමලාල් චම්පික කුමාරතිලක (නි/68653)
මේජර් විල්ලෝරගේ තුෂාර උපශාන්ත පෙරේරා (නි/68655)
තාවකාලික මේජර් කාරියප්පෙරුම මුදියන්සේලාගේ රොෂාන් රණසිංහ (නි/69560)
තාවකාලික මේජර් විජේසිංහ රාජපක්ෂ ආරච්චිල්ලාගේ චාමර ප්‍රසන්න (නි/69564)
තාවකාලික මේජර් වනසිංහ ආරච්චිගේ දොන් රුවන් සම්පත් අධිකාරි (නි/68658)
තාවකාලික මේජර් ලක්මාල් සුරංග වාසනා වැපිටිය (නි/69730)
කපිතන් දිසානායක මුදියන්සේලාගේ සුරංග උදය බණ්ඩාර (නි/68654)
කපිතන් ජයසේකර කංකානම් ආරච්චිගේ චතුරංග සඳරුවන් (නි/69563)
කපිතන් බ්‍රැන්ඩි ගම්පලගේ කසුන් එරන්ද (නි/68656)
කපිතන් හල්ගහ ගමරාලලාගේ ජනක ප්‍රසාද් කුමාර (නි/68659)
කපිතන් විජලත් ආරච්චිගේ වජිර ප්‍රසන්න විජේලත් (නි/69565)
තාවකාලික කපිතන් ජගත් ප්‍රියන්ත විජේතුංග (නි/68657)
තාවකාලික කපිතන් අබේසිංහ මොහොට්ටාලලාගේ අචල නිලංක අබේසිංහ (නි/70568)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 01 වැනි දින.
කොළඹ දී ය.

12-483/2

---

2021 අංක 1213

MOD/DEF/HRM/01/R/COM/CDT/21 (17)

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරින් 2018.09.23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් යටතේ දක්වා ඇති රෙජිමේන්තු/බලකායන් වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

2018.09.23 දින සිට

සී/85736 කෙඩෙට් නිලධාරි ගන්නිලේ ගමහොඳ කරුණාරත්න වාසල මුදියන්සේලෑ ෂෙහාන් දේවින්ද කරුණාරත්න ශ්‍රී ලංකා පාබල හමුදාව

සී/85744 කෙඩෙට් නිලධාරි රස්නැග් ගෙදර සශික ලක්ෂාන් බණ්ඩාර ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

සී/85746 කෙඩෙට් නිලධාරි පැලව අංගොඩ ගෙදර රනුෂ්ක ලයනාත් වික්‍රමසිංහ විජයබාහු පාබල රෙජිමේන්තුව

සී/85661 කෙඩෙට් නිලධාරි කත්‍රි ආරච්චිගේ සොනාල් බිම්සර චන්ද්‍රසේන ශ්‍රී ලංකා පාබල හමුදාව

සී/85673 කෙඩෙට් නිලධාරි මොහොට්ටි ආරච්චිගේ සිතුම් නිදර්ශණ විජේසිංහ ශ්‍රී ලංකා පාබල හමුදාව

සී/85690 කෙඩෙට් නිලධාරි පිට්ටැගම ගම්ලත් රාල්ලාගේ කනිෂ්ක ශානුක ගම්පත් ගැමුණු හේවා බලකාය

සී/85691 කෙඩෙට් නිලධාරි උළුවඩුගේ ශදීෂ වත්සල්‍ය අකලංක සන්නද්ධ බුද්ධ බලකාය

සී/85697 කෙඩෙට් නිලධාරි කොඩිතුවක්කු ආරච්චිගේ දිල්ශාන් මදුසංඛ කොඩිතුවක්කු ඉංජිනේරු සේවා බලකාය

සී/85699 කෙඩෙට් නිලධාරි කුරුප්පු ආරච්චිගේ සුදීප අකලංක කුරුප්පු ආරච්චි ගජබා රෙජිමේන්තුව

සී/85635 කෙඩෙට් නිලධාරි නල්ලා හන්දි තරිඳු රුක්ශාන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය

සී/85639 කෙඩෙට් නිලධාරි චරිත් ලක්ෂාන් ජයතුංග කමාන්ඩෝ රෙජිමේන්තුව

සී/85641 කෙඩෙට් නිලධාරි යාපා මුදියන්සේලාගේ සුධාරක දිමුතු බංඩාර ගජබා රෙජිමේන්තුව

සී/85650 කෙඩෙට් නිලධාරි උණ්ඩියේ ගෙදර සුපුන් කල්හාර ප්‍රේමරත්න කමාන්ඩෝ රෙජිමේන්තුව

සී/85653 කෙඩෙට් නිලධාරි යුෂාන් ධනුජ නයනංජන පැලවත්ත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

සී/85654 කෙඩෙට් නිලධාරි අහංගම විතානගේ නිශාන්ත ගැමුණු හේවා බලකාය

සී/85656 කෙඩෙට් නිලධාරි ලියන ආරච්චිගේ දොන් ඩෙවින් තමිඳු විශේෂ බලකාය

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 01 වැනි දින.
කොළඹ දී ය.

12-483/3

---

## රජයේ නිවේදන

*මගේ අංකය :* ආර්ජී/එන්බී/11/2/57/2021/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.12.17 වැනි දින සිට 2021.12.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.01.07 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ කොට්ඨාසයේ 624 වෙළුමේ 273 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අලුත්කුරු කෝරළේ, උතුරු කදිරානේ පිහිටි 'වෙස්ටර් සීටන් ෆාම්' නැමැති ඉඩමට බලයලත් මානක එම්. තිවේන්ද්‍රන් මහතා විසින් මැන සාදන අංක 191/1988.04.15 දිනැති පිඹුරේ ලොට් 01 සඳහා මායිම්, | 01. ඩබ්. එල්. වී. ඒ. රුද්‍රිගෝ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1990.08.20 දින ලියා සහතික කරන ලද අංක 5088 දරන බෙදුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුර* : 3131 පිඹුරේ ලොට් 01 හා 03<br>*නැගෙනහිර* : ඊ ෆැල්දර්ගේ ඉඩම<br>*දකුණ* : 191 පිඹුරේ ලොට් 03 හා 02<br>*බස්නාහිර* : එස්. අප්පුහාමිගේ ඉඩම සහ ඩී. සී. ජයවික්‍රමගේ ඉඩම.<br>ප්‍රමාණය : අ.02, රූ.00, පර්. 00 | |

**ඩබ්. එම්. එම්. බී. වීරසේකර,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12-442

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/53/2021/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.12.17 වැනි දින සිට 2021.12.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.01.07 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1347 වෙළුමේ 71 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, මාකන්දන පිහිටි "හිල් ක්‍රස්ට් ස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක සිරි. ඩී. ලියනසූරිය විසින් 1981.04.23 දින මැන සාදන ලද අංක 2222 දරන පිඹුරේ ලොට් 1J සඳහා මායිම්, | 01. එම්. එච්. ද ඒ. අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1982.06.17 දින ලියා සහතික කරන ලද අංක 5008 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුර* : වී. සී. පාර<br>*නැගෙනහිර* : පාර<br>*දකුණ* : ලොට් 01 ඒ හා 01 සී<br>*බස්නාහිර* : ලොට් 01 ඩී හා 01 කේ<br>ප්‍රමාණය : අ.03, රූ.02, පර්. 25 | 02. එම්. එච්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1985.05.01 දින ලියා සහතික කරන ලද අංක 3668 දරන ප්‍රකාශන ඔප්පුව. |

**ඩබ්. එම්. එම්. බී. වීරසේකර,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12-443

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/21/2021/පිටු/සෑ.

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2021.12.17 වැනි දින සිට 2021.12.31 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.01.07 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

#### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ 632 වෙළුමේ 300 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, ලියනගේමුල්ල පිහිටි "කටුනායක කරුඳුවත්ත *හෙවත්* ගෝනිවත්ත, නැමැති ඉඩමට බලයලත් මානක ඩී. ජේ. නානායක්කාර මහතා විසින් මැන සාදන ලද අංක 2525/1984.11.11 දිනැති පිඹුරේ ලොට් 80 සඳහා මායිම්, | 01. එස්. ඒ. එම්. එච්. සෙනෙවිරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1988.10.02 දින ලියා සහතික කරන ලද අංක 77 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුර* : ලොට් 79<br>*නැගෙනහිර* : ලොට් 78<br>*දකුණ* : අඳබිහිරි පාසල හා කර්මාන්තශාලාව<br>*බස්නාහිර* : මීගමුව -කොළඹ මහා මාර්ගය<br>ප්‍රමාණය : අ.00, රූ.00, පර්. 12 | 02. ජී. ඒ. විජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.05.11 දින ලියා සහතික කරන ලද අංක 2193 දරන විකුණුම් ඔප්පුව.<br><br>03. මීගමුව දිසා අධිකරණයේ අංක 6765/ඉඩම් දරන ලිස්පෙන්ඩනය. |
| ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ 631 වෙළුමේ 277 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළේ, ලියනගේමුල්ල පිහිටි "කටුනායක කරුඳුවත්ත *හෙවත්* ගෝනිවත්ත, නැමැති ඉඩමට බලයලත් මානක L. H. C. දාබරේරා මහතා විසින් මැන සාදන ලද අංක 115/1927.11.30 දිනැති පිඹුරේ ලොට් බී සඳහා මායිම්,<br><br>*උතුර* : ලොට් ඒ<br>*නැගෙනහිර* : සොලමන් ප්‍රනාන්දු, කේ. මැන්ඩිස් සිල්වා සොලමන් ප්‍රනාන්දු සහ ආරොන් සිල්වාගේ ඉඩම්<br>*දකුණ* : සෑම් ද සිල්වාගේ ඉඩම<br>*බස්නාහිර* : පාර<br>ප්‍රමාණය : අ.08, රූ.01, පර්. 05 | 01. එම්. ජේ. සී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.07.14 දින ලියා සහතික කරන ලද අංක 5477 දරන විකුණුම් ඔප්පුව. |

**ඩබ්. එම්. එම්. බී. වීරසේකර,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12-444

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ

**ස්වාධීන විගණකගේ වාර්තාව**

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ කළමනාකරණ මණ්ඩලය වෙත**

**මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ වාර්තාව**

**මතය**

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය, අරමුදල්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයක් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ ("පදනම") මූල්‍ය ප්‍රකාශන අපි විගණනය කළෙමු.

අනුගාමී මූල්‍ය ප්‍රකාශනවලින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව 2020 දෙසැම්බර් 31 දිනට පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව අපි අපගේ විගණනය පැවැත්වූවෙමු. එම ප්‍රමිති යටතේ අපගේ වගකීම අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම* යන කොටසේ තවදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (ආචාර ධර්ම සංග්‍රහය) අනුකූලව අපි පදනමෙන් ස්වාධීන වන අතර, ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අපගේ අනෙකුත් සදාචාර වගකීම් අපි ඉටුකර ඇත. අප ලබාගත් විගණන සාක්ෂිය අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බවට අපි විශ්වාස කරමු.

**අනෙකුත් තොරතුරු**

කළමනාකරණ මණ්ඩලය අනෙකුත් තොරතුරු සඳහා වගකීමට බැඳී සිටී. අනෙකුත් තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතය තුළින් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සහතික කිරීමේ නිගමනයක් අපි ප්‍රකාශ නොකරමු.

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්**

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරන දැක්මක් ලබදෙන ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණ මණ්ඩලයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

**මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්**

සමස්තයක් ලෙස මුල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා අතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මුල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි බවට අපේක්ෂා කෙරේ.

මුල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තරයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති වෙබ් අඩවිය වන : http://slaasc.com/auditing/auditorsresponsibility.php ඇතුළත් වේ. මෙම විස්තරය අපගේ විගණන වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසකි.

**වරලත් ගණකාධිකාරිවරු.**

2021 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ, ශ්‍රී ලංකාව.

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මුල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| *දෙසැම්බර් 31 දිනට,* | *සටහන* | *2020 රු.* | *2019 රු.* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ (සිත්නක්කර) | 3.1 | 989,026,292 | 1,003,459,376 |
| දේපල, පිරියත හා උපකරණ (CHOGM) | 3.2 | 9,610,796 | 9,836,051 |
| නොනිමි කාර්යය | | 4,326,144 | 690,862 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | 734,090 | 899,670 |
| ජංගම නොවන මුල්‍ය වත්කම් | 5 | 55,319,709 | 48,827,855 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,059,017,031** | **1,063,713,814** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 6 | 14,878,671 | 23,695,331 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු | 7 | 100,908,727 | 145,750,117 |
| කෙටි කාලීන ආයෝජන | 8 | 2,496,520,805 | 2,227,259,871 |
| තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම් | 9 | 39,638,827 | 69,343,925 |
| මුදල් හා මුදලට සමාන දෑ | 10 | 113,992,998 | 163,426,589 |
| | | **2,765,940,028** | **2,629,480,833** |
| **මුළු වත්කම්** | | **3,824,957.059** | **3,693,194,647** |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **අරමුදල්** | | | |
| ප්‍රාග්ධන සංචිතය | | 925,522 | 925,522 |
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 11 | 332,888,982 | 343,466,778 |
| CHOGM අරමුදල | 11 | 9,610,796 | 9,836,050 |
| එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අරමුදල (සමුච්චිත අරමුදල) | | 3,208,203,331 | 2,989,492,334 |
| | | **3,551,628,531** | **3,343,720,684** |

| | සටහන | *2019* *රු.* | *2018* *රු.* |
|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | |
| මූල්‍ය කල්බදු බැඳීම් | 12 | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 13 | 63,989,826 | 64,036,021 |
| | | **63,989,826** | **64,036,021** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවියයුතු | 14 | 111,578,425 | 176,548,287 |
| උපචිත වියදම් | 15 | 82,956,912 | 98,422,220 |
| බැංකු අයිරාව | 10 | 14,803,365 | 10,467,435 |
| | | **209,338,702** | **285,437,942** |
| **මුළු වගකීම්** | | **273,328,528** | **349,473,963** |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **3,824,957,059** | **3,693,194,647** |

පදනමේ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන අදාළ සටහන් සමඟ මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන SMEs සඳහා SLFRS අනුකූලව පිළියෙල කරන බව අපි මෙයින් සහතික කරමි.

……………………………......, ……………………..........,
මූල්‍ය ප්‍රධානී. ප්‍රධාන විධායක/ අධ්‍යක්ෂ.

SMEs සඳහා SLFRS අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණය මණ්ඩලය වගකීමට බැඳී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

……………………………......, ……………………..........,
සභාපති. Board Member
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.

2021 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ.

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ ආදායම් සහ වියදම් ප්‍රකාශය**

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,* | සටහන | *2020* *රු.* | *2019* *රු.* |
|---|---|---|---|
| ආදායම | 16 | 743,004,076 | 1,305,295,910 |
| සෘජු මෙහෙයුම් වියදම් | | (391,275,429) | (487,488,745) |
| **දළ අතිරික්තය** | | **351,728,647** | **817,807,265** |
| වෙනත් ආදායම | 17 | 32,448,900 | 37,307,434 |
| පරිපාලන වියදම් | | (155,739,475) | (205,951,474) |
| අලෙවිකරණ වියදම් | | (7,599,966) | (17,559,723) |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, | සටහන | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| මූල්‍ය වියදම් | 18 | (289,948) | (789,580) |
| වෙනත් වියදම් | 19 | (1,187,261) | (11,810,208) |
| **බදු වියදමට පෙර අතිරික්තය** | **20** | **218,710,897** | **619,003,714** |
| ආදායම් බදු වියදම | | - | - |
| **බදු වියදමට පසු අතිරික්තය** | | **218,710,897** | **619,003,714** |

පදනමේ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන අදාළ සටහන් සමඟ මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය.

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ අරමුදල්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | *ප්‍රාග්ධන සංචිතය රු.* | *එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අරමුදල (සමුච්චිත අරමුදල) රු.* | *ප්‍රාග්ධන ආධාර අරමුදල රු.* | *CHOGM අරමුදල රු.* | *එකතුව රු.* |
|---|---|---|---|---|---|
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **925,522** | **2,370,488,620** | **354,044,574** | **14,125,206** | **2,739,583,922** |
| වසර සඳහා අතිරික්තය | - | 619,003,714 | - | - | 619,003,714 |
| වසර තුළ භාවිතා කිරීම | - | - | (10,577,796) | (4,289,156) | (14,866,952) |
| **2019 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | **925,522** | **2,989,492,334** | **343,466,778** | **9,836,050** | **3,343,720,684** |
| වසර සඳහා අතිරික්තය | - | 218,710,897 | - | - | 218,710,897 |
| වසර තුළ භාවිතා කිරීම | - | - | (10,577,796) | (225,254) | (10,803,050) |
| **2020 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | **925,522** | **3,208,203,231** | **332,888,982** | **9,610,796** | **3,551,628,531** |

පදනමේ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන අදාළ සටහන් සමඟ මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය.

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,* | *සටහන* | *2020 රු.* | *2019 රු.* |
|---|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| බදු වියදමට පෙර අතිරික්තය | | 218,710,897 | 619,003,714 |
| **මුදල් නොවන ආදායම සහ වියදම් සඳහා ගැලපීම් :** | | | |
| දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ක්ෂය කිරීම | | 65,780,463 | 56,212,985 |
| අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | | 327,787 | 257,645 |
| පොළී ආදායම | | (219,939,325) | (229,590,587) |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම | | 4,810,077 | 4,254,256 |

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,* | *සටහන* | *2020* *රු.* | *2019* *රු.* |
|---|---|---|---|
| ණයගැතියන් වෙන්කිරීම/ කපාහැරීම | | - | 10,589,835 |
| දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද මුදල් | | (6,790,934) | (1,451,363) |
| කල්බදු පොළිය | | - | 228,390 |
| සීමාකළ අරමුදල්වල ක්‍රමක්ෂය | | (10,803,050) | (14,866,952) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **52,095,915** | **444,637,923** |
| **වෙනස්වීම් :** | | | |
| තොගය | | 8,816,660 | (4,643,292) |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු | | 44,841,390 | 14,732,739 |
| තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම් සහ වෙනත් | | 29,710,098 | (52,575,080) |
| වෙළෙඳ ගෙවිය යුතු වෙනත් ගෙවිය යුතු සහ උපචිත | | (80,435,170) | 11,785,752 |
| **මෙහෙයුම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **55,028,893** | **413,938,042** |
| ගෙවූ පාරිතෝෂිකය | | (4,856,272) | (7,954,448) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **50,172,621** | **405,983,594** |
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| ලද පොළී ආදායම | | 207,226,496 | 174,868,814 |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | | (51,915,283) | (99,836,270) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | | (162,207) | - |
| ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජන | | (256,548,105) | (421,019,787) |
| WIP හි ආයෝජන | | (3,635,282) | (690,862) |
| වත්කම් සහ පාරිභෝගික භාණ්ඩ බැහැර කිරීමෙන් ලත් මුදල් | | 7,584,094 | 1,537,024 |
| සේවක ණය (වැඩිවීම)/අඩුවීම | | (6,491,854) | (8,396,074) |
| **ආයෝජන කාර්යයන්හි භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(103,942,142)** | **(353,537,155)** |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| වසර තුළ ගෙවන ලද කල්බදු වාරිකය | | - | (5,055,520) |
| **මූල්‍ය කාර්යයන්හි භාවිතාකළ ශුද්ධ මුදල්** | | **-** | **(5,055,520)** |
| මුදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | (53,769,521) | 47,390,919 |
| වසර ආරම්භයේ දී මුදල් හා මුදලට සමාන දෑ | | 152,959,154 | 105,568,235 |
| **වසර අවසානයේ දී මුදල් සහ මුදලට සමාන දෑ** | 10 | **99,189,633** | **152,959,154** |

පදනමේ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන, අදාළ සටහන් සමග මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය.

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**1. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1 වාර්තාකරන ආයතනය**

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම (''පදනම'') ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනම් නීතිය යටතේ ස්ථාපිත කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ මෙහෙයුම්වල ප්‍රධාන කාර්යාලය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත.

**ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

ජාත්‍යන්තර සාමය, අවබෝධය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජීය ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර ගැටළු පිළිබඳ අධ්‍යයනය සහ සාකච්ඡාව ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම බෙදාහැරීම සහ කාර්යාල සඳහා පරිශ්‍රය කුළියට ලබාදීම සහ පොදු භාවිතය සඳහා ශාලා කුලියට ලබාදීම එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ ප්‍රධාන කාර්යයන් වේ.

**ජාත්‍යන්තර අධ්‍යයන සඳහා බණ්ඩාරනායක මධ්‍යස්ථානය**

ජාත්‍යන්තර සබඳතා, ජාත්‍යන්තර සාම නීතිය සහ රාජ්‍යෝපාය පිළිබඳ සියලුම අංශවල පර්යේෂණ අධ්‍යයන දිරිමත් කර ප්‍රවර්ධනය කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වේ.

**1.2 සකස් කිරීමේ පදනම**

(අ) අනුකූලතා ප්‍රකාශය

පදනමේ මූල්‍ය ප්‍රකාශ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් වියදම් ප්‍රකාශය, අරමුදල්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත වේ.

**මැනීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශ තුළ උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

**(ආ) කාර්යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර, එය පදනමේ කාර්යාත්මක ව්‍යවහාර මුදල වේ.

**(ඇ) ඇස්තමේන්තු සහ ගැලපීම් භාවිතය**

SLES සඳහා SLFRS සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම සහ වාර්තාකළ වත්කම්, වගකීම්, ආදයම් සහ වියදම්වල ප්‍රමාණවලට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික පළපුරුද්ද සහ පවත්නා වාතාවරණය යටතේ සාධාරණයයි විශ්වාස කරනු ලබන වෙනත් විවිධ සාධක මත පදනම් වන අතර, එහි ප්‍රතිඵලය අනෙකුත් මූලාශ්‍රවලින් පහසුවෙන් දැකිය නොහැකි වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම් පිළිබඳව විනිශ්චයන් සිදුකිරීමේ පදනම සකස් කරයි. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට ප්‍රතිශෝධන බලපානු ලබන්නේ මූල්‍ය වර්ෂයට පමණක් නම් ඇස්තමේන්තු සමාලෝචනය කරන කාලසීමාව තුළ හෝ ප්‍රතිශෝධන බලපානු ලබන්නේ වර්තමාන සහ අනාගත මූල්‍ය වර්ෂ සඳහා නම් ප්‍රතිශෝධන සහ අනාගත කාලසීමාව තුළ ප්‍රතිශෝධන හඳුනා ගනු ලබයි

**1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන සියලුම කාලසීමාවන් සඳහා අනුරූපව යොදා ගෙන ඇත.

**(*අ*) විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු**

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ගනුදෙනුවේ දිනයට පාලනය වන විදේශ විනිමය අනුපාතයට රුපියල්වලට පරිවර්තනය කෙරේ. වාර්තා කරන දිනයට විදේශ ව්‍යවහාර මුදලින් නම්කරන ලද මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයට පාලනය වන විදේශ විනිමය අනුපාතයට රුපියල්වලට පරිවර්තනය කෙරේ. පරිවර්තනය මත ඇතිවන විදේශ විනිමය වෙනස්වීම් ආදායම් සහ වියදම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

**(*ආ*) දේපළ, පිරියත සහ උපකරණ**

**(i) හඳුනාගැනීම සහ අගය කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ වැනි අයිතම සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට අගය කරනු ලබයි.

වත්කම් අත්කර ගැනීම සහ වත්කම් ඒවායේ වැඩකරන තත්ත්වයට ගෙනඒම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් පිරිවැයට ඇතුළත් වේ.

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ලාභ/ අලාභ දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමග බැහැර කිරීමෙන් ලද මුදල් සමග සැසඳීම මගින් තීරණය කරනු ලබන අතර, ආදායම් සහ වියදම් ප්‍රකාශනය තුළ "වෙනත් ආදායම" තුළ ශුද්ධ ලෙස හඳුනා ගනී.

**(ii) ක්ෂය කිරීම**

වත්කම්වල ඇස්තමේන්තුගත ජීවකාලය පුරා එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ සහ CHOGM අරමුදල සඳහා සරල මාර්ග ක්‍රමය මත ආදායම් සහ වියදම් ප්‍රකාශය තුළ ක්ෂය කිරීම හඳුනා ගනී.

වර්තමාන සහ තුළනාත්මක කාලසීමා සඳහා වත්කම්වල ක්ෂය කිරීමේ අනුපාතය පහත පරිදි වේ.

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

| | *ක්ෂය කිරීමේ අනුපාතය* |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| පුස්තකාල පොත්පත් | 20% |
| පිරියත සහ යන්ත්‍ර | 10% |
| මෝටර් රථ | 25% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 20% |
| සම්මන්ත්‍රණ පද්ධතිය | 12.5% |
| වෙනත් උපකරණ | 20% |

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම**

| | *ක්ෂය කිරීමේ අනුපාතය* |
|---|---|
| බුමුතුරුණු සහ තිර රෙදි | 33.3% |
| පිගන් කෝප්ප සහ හැඳි ගෑරුප්පු | 20% |
| විදුලි උපකරණ | 20% |
| ලිනන් | 12.5% |
| කන්ටේනර් | 10% |
| මාර්ග | 10% |
| අලෙවිසැල් | 10% |

**CHOGM 2013 අරමුදලේ වත්කම්**

| | *ක්ෂය කිරීමේ අනුපාතය* |
|---|---|
| දෙමුහුන් ගොඩනැගිල්ල | 3% |
| SBMEC ශාලා ගොඩනැගිල්ල | 2% |
| PVC ආවරණ | 50% |
| මෝටර් රථ | 25% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 20% |

**1.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)**

**(ඇ) අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක මෘදුකාංග බලපත්‍ර විශේෂ මෘදුකාංග අත්කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය පදනම මත ප්‍රාග්ධනීයකරණය කරනු ලබයි. මෙවැනි පිරිවැය හීනවන ශේෂ ක්‍රමය මත වසර අටක ඵලදායී ජීව කාලය පුරා මෙම ක්‍රමක්ෂය කෙරේ.

**(ඈ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු මත දේපල, පිරියත සහ උපකරණ (කල්බදු අයිතමවල අයිතියට ආනුශංගික සමස්ත අවදානම සහ ප්‍රතිලාභ පසුකාලීනව පදනමට ඵලදායී ලෙස මාරු කරන) ඒවායේ අත්පිට මුදලට ප්‍රාග්ධනීයකරණය කරන අතර, කල්බදු අයිතම භාවිතා කිරීමෙන් පදනම ප්‍රතිලාභ අපේක්ෂා කරන කාලසීමාව පුරා ක්ෂය/ක්‍රමක්ෂය කරනු ලබයි. කල්බදු හිමියාට ගෙවියයුතු අනුරූප ප්‍රධාන මුදල වගකීමක් ලෙස පෙන්නුම් කෙරේ.

එක් එක් කාලසීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත ස්ථිර කාලීන පොළී අනුපාතයක් ඉදිරිපත් කරමින් එක් එක් මූල්‍ය වර්ෂයට අදාළ කුලී බැඳීමේ පොළී කොටස කල්බදු කාලසීමාව පුරා ආදායම් සහ වියදම් ප්‍රකාශනයට අය කරනු ලබයි.

**(ඉ) තොගය**

තොගය පිරිවැයට අගය කෙරේ. තොගයේ පිරිවැය පෙර පිවිසි පෙර පිටවුම් මූලධර්මය මත පදනම් වන අතර, තොගය අත්කර ගැනීමේදී දරන ලද වියදම සහ එය පවත්නා ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද වෙනත් පිරිවැය එයට ඇතුළත්ය.

**(ඊ) ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු තුළ කෙටි කාලීන ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කෙරේ.

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**(ල) වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ**

අනෙකුත් අයවිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි වටිනාකම ඉදිරියට ගෙන යනු ලැබේ. වසර අවසානයේදී හිඟව පවත්නා සියලුම ප්‍රමාණ පිළිබඳ සමාලෝචනයක් මත පදනම් වී බොල් සහ අඩමාන ලැබිය යුතු දෑ සඳහා ඇස්තමේන්තුවක් සකස් කෙරේ.

**(ළ) මුදල් හා මුදලට සමාන දෑ**

අතැති මුදල්, බැංකුව සමග පවත්නා තැන්පතුවලින් මුදල් හා මුදලට සමාන දෑ සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල්, බැංකුව සමග පවත්නා තැන්පතු සහ ශුද්ධ බැංකු අයිරාවලින් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ, බැංකු අයිරා ජංගම වගකීම්වලට ඇතුළත් කෙරේ.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කරනු ලැබ ඇත.

**(එ) හානිකරණය**

හානිකරණය පිළිබඳ යම් හැඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වාර්තාකරන දිනයට පදනමේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයන් සමාලෝචනය කෙරේ. යම් එවැනි ඇඟවීමක් ඇත්නම්, එවිට, වත්කමේ අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කෙරේ.

වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල ඉක්මවා යයිනම්, හානිකරණ අලාභයක් හඳුනාගනී. හානිකරණ අලාභ ආදායම් සහ වියදම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

**(ඒ) වගකීම් සහ වෙන්කිරීම්**

ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත්වල පිටවයාමක් ඇති වේයයි අපේක්ෂිත නිරවුල් කිරීමක් වන අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් ඇති අවස්ථාවේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වගකීම් හඳුනාගනී. ණයහිමියන්ගේ ඉල්ලීමකදී හෝ වාර්තා කරන දිනයෙන් එක් වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වගකීම් ලෙස සලකනු ලබයි. වාර්තා කරන දිනයෙන් එක් වසරකට පසු ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස, පදනමට පහසුවෙන් ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ හිතකර බැඳීමක් ඇත්නම් සහ ආර්ථික ප්‍රතිලාභවල පිටවයාමක් බැඳීම නිරවුල් කිරීමට අවශ්‍ය වන්නේ නම්, වෙන් කිරීමක් හඳුනා ගනී.

**1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)**

**(ඔ) විශේෂිත අරමුදල්**

හඳුනාගත් කාර්යයක් තුළ භාවිතා කිරීම සඳහා අරමුදල් ලැබෙන අවස්ථාවක, එකී අරමුදල් විශේෂ අරමුදල් ගිණුමක තබන අතර, එම හඳුනාගත් කාර්යය සම්බන්ධයෙන් දරන ලද වියදම් සමග ගැලපීම සඳහා ආදායම සහ වියදම් ප්‍රකාශයට මාරු කෙරේ. භාවිතා නොකළ අරමුදල් ඒවාට අදාළ අරමුදල් ගිණුම්වල තබන අතර, ඒවා අවශ්‍ය විය හැකි කාලසීමාවක් දක්වා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුළත් කෙරේ.

**(ඕ) බදුකරණය**

ආදායම් බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ මෙම පදනම ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

**(ක) සේවක ප්‍රතිලාභ**

**i. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මෙම පදනමේ බැදීම වන්නේ වාර්තාකරන කාලසීමාව අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ බැදීමේ වර්තමාන වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව අගය කරනු ලබයි. නිශ්චිත ප්‍රතිලාභ බැදීමේ වර්තමාන අගය සේවකයා වර්තමාන සහ පූර්ව කාලසීමාව තුළ ඔහුගේ සේවා වෙනුවෙන් උපයාගෙන ඇති ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභය මට්ටම් කරමින් තීරණය කෙරේ.

උපකල්පන, වර්තමාන සේවා පිරිවැය සහ පොළිය තුළ වෙනස්වීම්වලින් ඇතිවන ලාභ සහ අලාභ ඒවා ඇතිවන කාලසීමාව තුළ ආදායම් සහ වියදම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂිතය සම්බන්ධයෙන් සියලුම සේවකයින් සඳහා විශ්‍රාම පාරිතෝෂිතය සඳහා වෙන්කිරීම් කෙරේ. පදනමෙන් පරිබාහිර අරමුදලක් තුළ මෙම වෙන්කිරීම ආයෝජනය නොකෙරේ. වෙන්කිරීම සඳහා බාහිරින් අරමුදල් ලබා නොගන්නා අතර, ආයුගණකයෙක් විසින් එය අගය කර නොමැත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කර ඇත.

**ii. නිශ්චිත දායක සැලැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා බැදීම් දරා ඇති පරිදි ආදායම් සහ වියදම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගනී. පදනම අර්ථ සාධක අරමුදල් සහ භාර අරමුදල් දායකත්වය ලෙස සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් පිළිවෙලින් 12% සහ 3% ක් දායක වේ.

**(ග) ආදායම**

**ආදායම හඳුනාගැනීම**

ආර්ථික ප්‍රතිලාභ පදනම වෙත ගලා එන සහ ආදායම සහ දරන ලද හෝ දැරීමට ඇති ආශ්‍රිත පිරිවැය පහසුවෙන් මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනා ගනී. වෙළෙඳ වට්ටම් සහ පිරිවැටුම් බද්දෙන් ශුද්ධ ලද හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට ආදායම මනිනු ලබයි.

**(ට) වියදම්**

පදනමේ මෙහෙයුම් තුළ සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා දරන ලද සියලුම වියදම් පදනමේ වසර සඳහා අතිරික්තය ගණන් කිරීමේදී අයකරනු ලැබ ඇත.

**(ඩ) මූල්‍ය වියදම්**

ණයගැනීම් මත පොළී වියදම, බැංකු ගාස්තු සහ හර බද්දෙන් මූල්‍ය වියදම් සමන්විත වේ. සියලුම ණය ගැනීම් පිරිවැය ආදායම් සහ වියදම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

**(න) තුළනාත්මක තොරතුරු**

පවත්නා වසරේ ඉදිරිපත් කිරීම සමග අනුකූලවීම සඳහා අවශ්‍ය තැන්හිදී, තුලනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත.

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්**

**1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)**

(ත) වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම්

සියලුම වැදගත් පසු වාර්තාකරණ සිදුවීම් සලකා බලා ඇති අතර, සුදුසු පරිදි, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

(ද) බැඳීම් සහ අසමභාව්‍යතා

අසම්භව්‍යතා යනු පදනමේ පාලනයෙන් තොර අතීත සිදුවීමකින් ඇතිවන සහ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කළහැකි විභව වත්කම් හෝ බැඳීමය.

බැඳීම් සහ අසම්භාව්‍යතා මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 22හි අනාවරණය කෙරේ.

**2 මෙහෙයුම් අංශ**

**2.1 මෙහෙයුම් අංශ සඳහා පදනම**

පදනමට පහත සඳහන් අංශ දෙක අයත්වන අතර, ඒවා එහි වාර්තාකළ හැකි අංශ වෙති. මෙම අංශ විවිධ සේවා පිරිනමන අතර, මෙහෙයුම සහ අලෙවිකරණය තුළ විවිධ උපාය මාර්ග අවශ්‍ය වන බැවින් වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි.

- BMICH සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය (BMICH)
- අන්තර ජාතික අධ්‍යයන සඳහා බණ්ඩාරනායක මධ්‍යස්ථානය ( BCIS)

**2.2 වාර්තාකළ හැකි අංශ පිළිබඳ තොරතුරු**

| *2020* | *වාර්තාකළ හැකි අංශ* | | *එකතුව* |
|---|---|---|---|
| | *BMICH* | *BCIS* | *BNMF* |
| *ආදායම් සහ වියදම් පිළිබඳ අංශ ප්‍රකාශය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| ආදායම | 706,597,961 | 36,406,115 | 743,004,076 |
| සෘජු මෙහෙයුම් වියදම් | (286,505,665) | (7,749,744) | (294,255,409) |
| **දළ අතිරික්තය** | **420,092,296** | **28,656,371** | **448,748,667** |
| වෙනත් ආදායම් | 32,289,98 | 158,911 | 32,448,900 |
| **වෙනත් ආදායමෙන් පසු දළ අතිරික්තය** | **452,382,285** | **28,815,282** | **481,197,567** |
| පරිපාලන වියදම් | (217,734,171) | (35,025,324) | (252,759,495) |
| අලෙවිකරණ වියදම් | (70,07,348) | (592,618) | (7,599,966) |
| මූල්‍ය පිරිවැය | (272,523) | (17,425) | (289,948) |
| වෙනත් වියදම් | (1,546,439) | (290,822) | (1,837,261) |
| **බදු වියදම** | - | - | - |
| **ශුද්ධ අතිරික්තය/(හිඟය)** | **225,821,804** | **(7,110,907)** | **218,710,897** |

| | *වාර්තාකළ හැකි අංශ* | | *එකතුව* |
|---|---|---|---|
| | *BMICH* | *BCIS* | *BNMF* |
| *මූල්‍ය තත්ත්වය පිළිබඳ අංශ ප්‍රකාශය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| මුළු ජංගම නොවන වත්කම් | 1,058,939,559 | 77,472 | 1,059,017,031 |
| **මුළු ජංගම වත්කම්** | 2,830,323,24 | 253,896,351 | 3,084,219,375 |
| (-) අන්තර් අංශ ලැබීම් ඉවත් කිරීම | (318,279,47) | - | (318,279,347) |
| **මුළු වත්කම්** | **3,570,983,236** | **25,973,823** | **3,824,957,059** |
| මුළු අරමුදල් | 3,632,233,938 | (80,605,407) | 3,551,628,531 |
| මුළු ජංගම නොවන වගකීම් | 59,475,612 | 4,514,213 | 63,989,825 |
| මුළු ජංගම වගකීම් | 197,553,033 | 330,065,017 | 527,618,050 |
| (-) අන්තර් අංශ ගෙවීම් ඉවත් කිරීම | - | (318,279,347) | (318,279,347) |
| **මුළු අරමුදල් සහ වගකීම්** | 3,889,262,583 | (64,305,524) | 3,824,957,059 |

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් දෙසැම්බර් 31 දිනට**

**2 මෙහෙයුම් අංශ**

2.2 වාර්තා කළ හැකි අංශ පිළිබඳ තොරතුරු (*ඉතිරි කොටස*)

| *2019* | *වාර්තාකළ හැකි අංශ* | | *එකතුව* |
|---|---|---|---|
| | *BMICH* | *BCIS* | *BNMF* |
| *ආදායම් සහ වියදම් පිළිබඳ අංශ ප්‍රකාශය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| ආදායම | 1,256,825,501 | 48,470,409 | 1,305,295,910 |
| සෘජු මෙහෙයුම් වියදම් | (476,764,482) | (10,724,163) | (487,488,645) |
| **දළ අතිරික්තය** | **780,061,019** | **37,746,246** | **817,807,265** |
| වෙනත් ආදායම් | 32,803,040 | 4,504,394 | 37,307,434 |
| **වෙනත් ආදයමෙන් පසු දළ අතිරික්තය** | **812,864,059** | **42,250,640** | **855,114,699** |
| පරිපාලන වියදම් | (157,793,634) | (48,157,840) | (205,951,474) |
| අලෙවිකරණ වියදම් | (16.225,885) | (1,333,838) | (17.559,723) |
| මූල්‍ය පිරිවැය | (778,955) | (10,625) | (789,580) |
| වෙනත් වියදම් | (11,562,205) | (248,003) | (11,810,208) |
| **බදු වියදම** | - | - | - |
| **ශුද්ධ අතිරික්තය/(හිඟය)** | **626,503,380** | **(7,499,666)** | **619,003,714** |

| | *වාර්තාකළ හැකි අංශ* | | *එකතුව* |
|---|---|---|---|
| | *BMICH* | *BCIS* | *BNMF* |
| *මූල්‍ය තත්ත්වය පිළිබඳ අංශ ප්‍රකාශය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| මුළු ජංගම නොවන වත්කම් | 1,063,552,917 | 160,897 | 1,063,713,814 |
| **මුළු ජංගම වත්කම්** | 2.694,205,553 | 229,431,782 | 2,923,637,335 |
| (-) අන්තර් අංශ ලැබීම් ඉවත් කිරීම | (294,156,502) | - | (294,156,502) |
| **මුළු වත්කම්** | **3,463,601,969** | **229,592,679** | **3,693,194,647** |
| මුළු අරමුදල් | 3,417,215,182 | (73,494,497) | 3,343,720,684 |
| මුළු ජංගම නොවන වගකීම් | 59,468,853 | 4,567,168 | 64,036,022 |
| මුළු ජංගම වගකීම් | 281,074,436 | 298,520,007 | 579,594,443 |
| (-) අන්තර් අංශ ගෙවීම් ඉවත් කිරීම | - | (294,156,502 | 294,156,502 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | **3,757,758,471** | **(64,563,824)** | **3,693,194,647** |

**3.1 දේපළ, පිරියත හා උපකරණ - සින්නක්කර වත්කම්**

| *පිරිවැය* | *2020 ජනවාරි 01 දිනට ශේෂය* | *එකතු කිරීම්* | *බැහැර කිරීම්* | *2020 දෙසැම්බර් 01 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| ගොඩනැගිලි | 971,501,608 | 9,447,759 | (351,085) | 980,598,282 |
| පිරියත සහ යන්ත්‍ර | 94,515,109 | - | (1,500,000) | 93,015,109 |

**එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්**

**දෙසැම්බර් 31 දිනට,**

| *පිරිවැය* | *2020 ජනවාරි 01 දිනට ශේෂය රු. ශත* | *එකතු කිරීම් රු. ශත* | *බැහැර කිරීම් රු. ශත* | *2020 දෙසැම්බර් 01 දිනට ශේෂය රු. ශ.* |
|---|---|---|---|---|
| මෝටර් රථ | 66,006,807 | - | - | 66,006,807 |
| වෙනත් උපකරණ | 28,260,691 | 2,608,479 | - | 30,869,170 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 57,957,119 | 890,958 | - | 58,848,077 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 4,168,856 | 32,157,226 | - | 36,326,082 |
| පිගන් කෝප්ප සහ හැඳි ගැරුප්පු | 226,553 | - | - | 226,553 |
| විදුලි උපකරණ | 88,487,868 | 6,810,861 | (120,000) | 95,178,729 |
| කන්ටේනර් | 960,862 | - | - | 960,862 |
| මාර්ග | 33,532,639 | - | - | 33,532,639 |
| අලෙවි සැල් | 4,962,395 | - | - | 4,962,395 |
| | **1,350,580,507** | **51,915,283** | **(1,971,085)** | **1,400,524,706** |

| *සමුච්චිත ක්ෂය කිරීම්* | *2020 ජනවාරි 01 දිනට ශේෂය රු. ශත* | *වසර සඳහා ක්ෂය කිරීම රු. ශත* | *බැහැර කිරීම් මත ක්ෂය කිරීම රු. ශත* | *2020 දෙසැම්බර් 01 දිනට ශේෂය රු. ශත* |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 114,767,826 | 20,026,184 | (40,375) | 134,753,635 |
| පිරියත සහ යන්ත්‍ර | 6,292,796 | 12,136,836 | (1.023,750) | 17,405,882 |
| මෝටර් රථ | 65,909,254 | 97,553 | - | 66,006,807 |
| වෙනත් උපකරණ | 18,646,413 | 4,736,874 | - | 23,383,287 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 48,066,487 | 3,535,400 | - | 51,601,887 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 2,472,929 | 11,446,846 | - | 13,919,775 |
| පිගන් කෝප්ප සහ හැඳි ගැරුප්පු | 240,350 | - | - | 240,350 |
| විදුලි උපකරණ | 62,584,067 | 10,222,251 | (113,800) | 72,692,518 |
| කන්ටේනර් | 960,862 | - | - | 960,862 |
| මාර්ග | 22,217,752 | 3,353,264 | - | 25,571,016 |
| අලෙවි සැල් | 4,962,395 | - | - | 4,962,395 |
| | **347,121,131** | **65,555,208** | **(1,177,925)** | **411,498,414** |
| **ශුද්ධ පොත් අගය** | **1,003,459,376** | | | **989,026,292** |

**3.2 දේපල, පිරියත සහ උපකරණ - CHOGM වත්කම්**

| *පිරිවැය* | *2020 ජනවාරි 01 වැනි දිනට ශේෂය රු.* | *එකතු කිරීම් රු.* | *බැහැර කිරීම් රු.* | *2020 දෙසැම්බර් 01 වැනි දිනට ශේෂය රු.* |
|---|---|---|---|---|
| PVC ආවරණ | 4,924,368 | - | - | 4,924,368 |
| කැබලි xi/x2/x3/x4 දෙමුහුන් ගොඩනැගිල්ල | 7,053,000 | - | - | 7,053,000 |
| බුමුතුරුණු | 9,810,129 | - | - | 9,810,129 |
| විදුලි උපකරණ | 7,079,464 | - | - | 7,079,464 |

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්**

*දෙසැම්බර් 31 දිනට,*

| *පිරිවැය* | *2020 ජනවාරි 01 වැනි දිනට ශේෂය රු.* | *එකතු කිරීම් රු.* | *බැහැර කිරීම් රු.* | *2020 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය රු.* |
|---|---|---|---|---|
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 22,758,252 | - | - | 22,758,252 |
| වෙනත් උපකරණ | 2,899,800 | - | - | 2,899,800 |
| SBMEC-F ශාලා ගොඩනැගිල්ල | 4,209,691 | - | - | 4,209,691 |
| මෝටර් රථ | 7,826,002 | | - | 7,826,002 |
| | **66,560,706** | - | - | **66,560,706** |

| *සමුච්චිත ක්ෂය කිරීම* | *2020 ජනවාරි 01 වැනි දිනට ශේෂය රු.* | *වසර සඳහා ක්ෂය කිරීම රු.* | *බැහැර කිරීම මත ක්ෂය කිරීම රු.* | *2020 දෙසැම්බර් 01 වැනි දිනට ශේෂය රු.* |
|---|---|---|---|---|
| PVC ආවරණ | 4,924,368 | - | - | 4,924,368 |
| කැබලි xi/x2/x3/x4 දෙමුහුන් ගොඩනැගිල්ල | 924,848 | 141,060 | - | 1,065,908 |
| බුමුතුරුණු | 9,810,129 | - | - | 9,810,129 |
| විදුලි උපකරණ | 7,079,464 | - | - | 7,079,464 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 22,758,252 | - | - | 22,758,252 |
| වෙනත් උපකරණ | 2,899,800 | - | - | 2,899,800 |
| SBMEC-F ශාලා ගොඩනැගිල්ල | 501,793 | 84,195 | - | 585,988 |
| මෝටර් රථ | 7,826,002 | - | - | 7,826,002 |
| | 56,724,656 | 225,255 | - | 56,949,911 |
| ශුද්ධ පොත් අගය | 9,836,051 | | | 9,610,796 |

| | *2020 රු.* | *2019 රු.* |
|---|---|---|
| **4 අස්පෘශ්‍ය වත්කම්** | | |
| **පිරිවැය** | | |
| වසර ආරම්භයේදී ශේෂය | 2,544,685 | 2,544,685 |
| වසර තුළ එකතු කිරීම් | 162,207 | - |
| වසර අවසානයේදී ශේෂය | **2,706,892** | **2,544,685** |
| **ක්‍රමක්ෂය** | | |
| වසර ආරම්භයේදී ශේෂය | 1,645,015 | 1,387,369 |
| වසර තුළ ක්‍රමක්ෂය | 327,787 | 257,645 |
| වසර අවසානයේදී ශේෂය | **1,972,802** | **1,645,015** |
| **ධාරණ අගය** | **734,090** | **899,670** |

| *දෙසැම්බර් 31 දිනට,* | *2020* *රු.* | *2019* *රු.* |
|---|---|---|
| 5 ජංගම නොවන මූල්‍ය වත්කම් *සේවක ණය* | | |
| වසර ආරම්භයේදී ශේෂය | 48,827,855 | 40,431.781 |
| වසර තුළ ලබාදුන් ණය | 23,755,277 | 29,641,070 |
| වසර තුළ ණය ආපසු ගෙවීම | (17,263,423) | (21,244,996) |
| වසර අවසානයේදී ශේෂය | **55,319,709** | **48,827,855** |
| **6 තොගය** | | |
| තොගය | 16,614,369 | 25,431,029 |
| (-) තොගය සඳහා වෙන්කිරීම | (1,735,698) | (1,735,698) |
| | **14,878,671** | **23,695,331** |
| **7 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු** | | |
| **වෙළෙඳ ලැබිය යුතු (සටහන 7.1)** | 90,047,845 | 138,690,918 |
| **වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු - ප්‍රතිපූරණය (සටහන 7.2)** | 9,115,038 | 6,362,114 |
| වෙනත් ණයගැතියෝ **(සටහන 7.3)** | 6,200 | 455,875 |
| වෙනත් ලැබිය යුතු **(සටහන 7.4)** | 1,739,643 | 241,210 |
| | **100,908,727** | **145,750,117** |
| **7.1 වෙළෙඳ ලැබිය යුතු** | | |
| වෙළෙඳ ලැබිය යුතු | 147,342,272 | 208,521,006 |
| (-) අඩමාන ණය සඳහා වෙන්කිරීම | (57,294,427) | (69,830,088) |
| | **90,047,845** | **138,690,918** |
| **7.2 වෙනත් ලැබිය යුතු - ප්‍රතිපූරණය** | | |
| වෙනත් ලැබිය යුතු - ප්‍රතිපූරණය | 40,731,764 | 38,061,982 |
| (-) කුලී ලැබීම් සඳහා වෙන්කිරීම | (31,616,726) | (31,699,868) |
| | **9,115,038** | **6,362,114** |
| **7.3 විවිධ ණයගැතියෝ** | | |
| විවිධ ණයගැතියෝ | 6,200 | 2,490,032 |
| (-) වෙනත් ණයගැතියෝ සඳහා වෙන්කිරීම | - | (2,034,157) |
| | **6,200** | **455,875** |
| **7.4 වෙනත් ලැබිය යුතු** | | |
| වෙනත් ලැබිය යුතු | 241,210 | 4,891,833 |
| ලැබිය යුතු එ.අ.බදු (VAT) | 1,498,433 | - |
| (-) වෙනත් ලැබිය යුතු සඳහා වෙන්කිරීම | - | (4,650,623) |
| | **1,739,643** | **241,210** |

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්**

| *දෙසැම්බර් 31 දිනට,* | *2020* | *2019* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **8 කෙටි කාලීන ආයෝජන** | | |
| ස්ථිර තැන්පතු | 2,496,520,805 | 2,227,259,871 |
| | **2,496,520,805** | **2,227,259,871** |
| **9 තැන්පතු, පෙර ගෙවීම් සහ අත්තිකාරම්** | | |
| සේවකයින්ට අත්තිකාරම් | 4,485,560 | 5,735,160 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු **(සටහන 9.1)** | 556,354 | 556,354 |
| පෙර ගෙවීම් | 3,904,117 | 13,549,175 |
| අත්තිකාරම් ගෙවීම **(සටහන 9.2)** | 19,876,410 | 39,709,513 |
| ලැබිය යුතු රඳවාගත් බදු (WHT) | 10,816,386 | 9,798,723 |
| | **39,638,827** | **69,348,925** |
| **9.1 ආපසු ගෙවන තැන්පතු** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 656,504 | 656,504 |
| (-) ආපසු ගෙවිය යුතු තැන්පතු සඳහා වෙන්කිරීම | (100,150) | (100,150) |
| | **556,354** | **556,354** |
| **9.2 අත්තිකාරම් ගෙවීම** | | |
| අත්තිකාරම් ගෙවීම | 21,839,869 | 42,451,972 |
| (-) අත්තිකාරම් ගෙවීම සඳහා වෙන්කිරීම | (1,963,459) | (2,742,459) |
| | **19,876,410** | **39,709,513** |
| **10 මුදල් හා මුදලට සමාන දෑ** | | |
| බැංකුවේ මුදල් | 113,882,403 | 163,287,619 |
| අතැති මුදල් | 110,595 | 138,970 |
| | **113,992,998** | **163,426,589** |
| (-) බැංකු අයිරාව | (14,803,365) | (10,467,435) |
| මුදල් ප්‍රවාහ අරමුණ සඳහා ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ | **99,189,633** | **152,959,154** |
| **11 විශේෂ අරමුදල්** | | |
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 332,888,982 | 343,466,778 |
| CHOGM 2013 වසරේ අරමුදල | 9,610,796 | 9,836,050 |
| | **342,499,778** | **353,302,828** |
| **12 මූල්‍ය කල්බදු බැඳීම්** | | |
| වසර ආරම්භයේදී ශේෂය | - | 5,055,520 |
| වසර තුළ ලබා ගැනීම | - | - |
| වසර තුළ ගෙවූ | - | 5,055,520 |
| වසර අවසානයේදී ශේෂය | - | - |

**එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්**

| *දෙසැම්බර් 31 දිනට,* | *2020* | *2019* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **පොළිය** | | |
| වසර ආරම්භයේදී ශේෂය | - | 228,390 |
| වසර තුළ එකතු කිරීම් | - | - |
| ආදායම් ප්‍රකාශනයට අයකළ පොළිය | | (228,390) |
| වසර අවසානයේදී ශේෂය | - | - |
| අවම කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකම | - | - |
| **13 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම** | | |
| වසර ආරම්භයේදී ශේෂය | 64,036,021 | 67,736,213 |
| වසර තුළ සිදුකළ වෙන්කිරීම | 4,810,077 | 4,254,256 |
| වසර තුළ ගෙවන ලද ගෙවීම් | (4,856,272) | (7,954,448) |
| වසර අවසානයේදී ශේෂය | **63,989,826** | **64,036,021** |
| **14 වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු** | | |
| වෙළෙඳ ණයහිමියෝ | 28,690,410 | 45,148,558 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 25,429,828 | 31,487,557 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 2,639,897 | 2,490,897 |
| අත්තිකාරම් සංචිතය | 54,818,290 | 97,421,275 |
| | **111,578,425** | **176,548,287** |
| **15 උපචිත වියදම්** | | |
| ගෙවියයුතු ව්‍යවස්ථාපිත | 671,342 | 106,150 |
| ගෙවියයුතු දිරිදීමනා | 45,415,381 | 72,522,728 |
| විවිධ උපචිත වියදම් | 26,879,333 | 17,141,915 |
| ගෙවියයුතු වෙනත් බදු | - | 3,116,695 |
| නොගෙවූ වැටුප් | 5,356,492 | 1,046,235 |
| විගණනය සහ වෙනත් සේවා | 4,634,364 | 4,488,497 |
| | **82,956,912** | **98,422,220** |

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා,* | *2020* | *2019* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **16 ආදායම** | | |
| කුළියට දීමේ ආදායම | 175,896,762 | 645,480,786 |
| කුළී ආදායම | 283,003,061 | 300,281,434 |
| පොළී ආදායම | 219,939,325 | 229,590,587 |
| කොමිස් ආදායම | 44,837,745 | 98,734,378 |
| භාෂා පාඨමාලා ගාස්තුව | 5,936,250 | 11,493,325 |
| අන්තර්ජාතික සබඳතා පාඨමාලා ගාස්තුව | 13,390,933 | 19,715,400 |
| | **743,004,076** | **1,305,295,910** |

| | *2020* | *2019* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **17 වෙනත් ආදායම** | | |
| සීමාකළ අරමුදල්වල ක්‍රමක්ෂය | 10,803,050 | 14,866,952 |
| විවිධ ලැබීම් ආදායම | 2,424,165 | 4,681,503 |
| දුරකථන ආදායම | 11,988,075 | 11,493,373 |
| වත්කම් බැහැර කිරීම මත ලාභ | 6,662,219 | - |
| විවිධ ආදායම් | 404,147 | 263,047 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හි අධික වෙන් කිරීම | - | 364,775 |
| සම්මන්ත්‍රණ හා අදාළ ආදායම | 30,196 | 4,186,421 |
| සුන්බුන් අයිතම බැහැර කිරීමේ ආදායම | 128,715 | 1,451,363 |
| "සිරිමාවෝ" ප්‍රකාශන අලෙවි-ආදායම | 8,333 | - |
| | **32,448,900** | **37,307,434** |
| **18 මූල්‍ය වියදම්** | | |
| කල්බදු පොළිය | - | 540,565 |
| බැංකු ගාස්තු | 284,698 | 249,015 |
| මුද්දර බදු වියදම | 5,250 | - |
| | **289,948** | **789,580** |
| **19 වෙනත් වියදම්** | | |
| වත්කම් බැහැර කිරීම | - | 484,825 |
| වෙනත් ලැබිය යුතු සඳහා වෙන් කිරීම | - | 6,742,398 |
| ණයගැතියන් සඳහා වෙන් කිරීම සහ | - | 4,334,982 |
| කපා හැරීම | 1,190,169 | - |
| වන්දි ගෙවීම | - | 248,003 |
| සම්මන්ත්‍රණ හා ප්‍රකාශන වියදම | 206,269 | - |
| දායක මුදල් - පුස්තකාලය | 84,553 | - |
| විදේශ සංචාර වියදම් | 356,270 | - |
| | **1,837,261** | **11,810,208** |

**20 බදු පෙර අතිරික්තය**

පහත සඳහන් අයිතම බදු පෙර අතිරික්තය තීරණය කිරීමේදී පහත සඳහන් අයිතම වියදම් ලෙස හඳුනාගෙන ඇත :

| | | |
|---|---|---|
| සේවක පිරිවැය | 262,049,756 | 288,679,965 |
| නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය - සේ.අ.අ. සහ | 18,764,449 | 18,708,396 |
| සේ.භා.අ. | 4,810,077 | 4,254,256 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – පාරිතෝෂිකය | 66,108,250 | 56,470,631 |
| ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය | 1,500,000 | 1,500,000 |

**21 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**

**21.1 ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු**

පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස පදනම සලකනු ලබයි. පදනමේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ගෙවන වන්දි මුදල පහත පරිදි වේ.

| | *2020* | *2019* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| කෙටි කාලීන ප්‍රතිලාභ | - | - |
| | - | - |

**22 බැඳීම් සහ අසම්භාව්‍යතා**

වාර්තා කරන දිනය අවසානයට මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමට හෝ අනාවරණය කළ යුතු වැදගත් ප්‍රාග්ධන බැඳීම් හෝ අසම්භාව්‍යතා කිසිවක් නොමැත.

**23 නඩුකීම් සහ හිමිකම් පෑම්**

වාර්තා කරන දිනට පදනමට විරුද්ධව පහත සඳහන් නඩු විභාග වෙමින් පවතී:

23.1. L.T.01/70/2020 එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට එදිරිව යූ. පී. යසරත්න

23.2. CC/C/IR/2/512/2020 එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට එදිරිව කේ. සී. ඒ. කුරුප්පුආරච්චි

23.3. CC/C/G/2/85/2021 එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට එරෙහිව යූ. පී. යසරත්න.

**24 වාර්තාකරණ දිනයට පසු සිදු වූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් හෝ අනාවරණය කළ යුතු වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් කිසිවක් නොමැත.

**25 වෙනත් කරුණු : කොවිඩ් 19 වසංගතයේ බලපෑම**

කොවිඩ් 19 වසංගතයේ පැතිරීම සහ වසංගතයේ පැතිරීම අවම කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පදනම කෙරෙහි මධ්‍යස්ථ බලපෑමක් සිදුකර ඇත.

පදනම විසින් ලාභදායිත්වය, මුදල් සංචිත, ඵලදායී කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ශක්තිමත් ශුද්ධ වත්කම් තත්ත්වය සහ මූල්‍ය පහසුකම්වල විභව මූලාශ්‍ර වැනි සාධක සලකා බලා එහි ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට ලක් කර ඇති අතර, වඩා හොඳ කොන්දේසි සහිතව මූල්‍ය වගකීම් සාකච්ඡා කර වියදම් පාලනය කර ඇත. එබැවින් ද්‍රවශීලතා අවදානම හේතුවෙන් පැන නගින අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ද්‍රව්‍යමය අවිනිශ්චිතතා නොමැති බව පදනම විශ්වාස කරයි.

තවද, පදනම විසින් රජය විසින් නිකුත් කරන ලද සියලුම මාර්ගෝපදේශ මෙන්ම ජාත්‍යන්තර මනා පරිචයන් ඇගයීමට ලක් කර ඇති අතර, සේවකයින්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා සුදුසු සේවා විධිවිධාන සහ ආරක්ෂිත කොන්දේසි සහතික කිරීම සඳහා පදනම සෞඛ්‍ය සහ ආරක්ෂණ මාර්ගෝපදේශ සකස් කර ඇත.

**26 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වගකීම**

SMES සඳහා SLFRS වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී

### ඌරුබොක්ක ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ජංගම ගිණුම් අංකය : 1236002929
ඇහැලකන්ද ටී ෆැක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ණය ගිණුම් අංක : 2238911, 2252595 සහ 2440076

2021 අප්‍රේල් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එල්. දී. සිල්වා විසින් 2018 මාර්තු 27 වැනි දින සහතික කරන ලද අංක 515 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද උකස් බැඳුම්කරය යටතේ එකී උකස් බැඳුම්කරයට අදාළ උපලේඛනයේ සහ/හෝ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් ගෙවීම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන මාවරල, ගෝමිල, ලියාපදිංචි කාර්යාලයේ පිහිටා ඇති ඇහැලකන්ද ටී ෆැක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ් ලියාපදිංචි කිරීමේ අංකය PV 5767 දරන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් වෙනත් කරුණු අතර එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන අසූහතක (රු. 87,000,000.00) මුදලක් 2021 ජනවාරි 31 වැනි දින වන විට එහි පොලිය සමඟ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අසූහත (රු. 87,000,000.00)ක මුදල අය කර ගැනීම සඳහා සහ 2021 පෙබරවාරි 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 21,409,868.28ක මුදලක් මත වර්ෂයකට 28% බැගින් රු. 54,867,700.00 මුදලක් මත වර්ෂයකට AWPLR අගය + 2.5% බැගින් (වර්තමානයේ වර්ෂයකට 8.33% බැගින්) සහ රු. 9,400,000.00 ක මුදලක් මත වර්ෂයකට 13.5% බැගින් සහ රු. 1,322,431.72ක මුදලක් මත වර්ෂයකට 14% බැගින් වැඩිදුර පොලිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 515 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 70A, ඇහැලකන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මොරවක් කෝරළේ, ඇහැලකන්ද ගමේ පිහිටි ගුලනහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. රංගොඩගේ විසින් 2018.01.18 වැනි දින පිළියෙල කරන ලද අංක 2274 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම ඉඩමේ B සහ මාතර සිට කොටපොල දක්වා ප්‍රධාන පාර මගින් ද, නැගෙනහිරට : දෙනිහේන දොල සහ ලබුවැල්ලහේන මගින් ද, දකුණට : ලබුවැල්ලහේන, එම ඉඩමේ ලොට් D සහ හපුගහතැන්නහේන මගින් ද සහ බස්නාහිරට : මවරල ගම මගින් ද මායිම් වූ එකී අංක 2274 දරන පිඹුර ප්‍රකාරව අක්කර පනස් එකයි, රූඩ් එකයි පර්චස් විසි පහක (අ.51, රූ.1, පර්.25) විශාලත්වයෙන් වූ ඉඩම සමග පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් එහි පිහිටි සවිකිරීම්, උපාංග, යන්ත්‍රෝපකරණ සමස්ථය සහ මෙහි විස්තර කරන ලද සවිකරන ලද යන්ත්‍රෝපකරණ සමඟ වේ.

පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වන අතර 2274 දරන පිඹුරේ එකී ලොට් C

ඉහත කී ඇහැලකන්ද හි පිහිටි ගුලනහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් 1991.01.24 වැනි දින පිළියෙල කරන ලද අංක 10 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් B මගින් ද, නැගෙනහිරට : දෙනිහේන දොල සහ ලබුවැල්ලහේන මගින් ද, දකුණට : ලබුවැල්ලහේන, ලොට් D සහ

හපුගහතැන්නහේන මගින් ද සහ බස්නාහිරට ; මාවරල මගින් ද මායිම් වූ එකී අංක 10 දරන පිඹුර ප්‍රකාරව අක්කර පනස් එකයි රූඩ් එකයි පර්චස් විසි හතක (අ.51, රූ.1, පර්.27) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය කොටපොල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව G 48/306 යටතේ ලියාපදිංචි කර ඇත.

| *Item No.* | *Description* |
|---|---|
| 01. | 75' * 6' Trough *2 Units |
| 02. | 47" Tea Roller (CCC) - 24 years old |
| 03. | 46 1/2" - Tea Roller (Walkers) - 24 years |
| 04. | 44- Tea Rollers (CCC) - 24 years old |
| 05. | 44 - Tea Roller (CCC) - 4 years old |
| 06. | 40 - Tea Roller (CCC) - 24 years old |
| 07. | 03 - Roll Breakers |
| 08. | 02 - Humidity fires |
| 09. | 01 - Dust Fan (4ft) |
| 10. | 6ft Drier (CCC) - 25 years old |
| 11. | 6 ft. Drier (Tempest) - 19 years old |
| 12. | Six Cylinder Fiber mat (1993) |
| 13. | Six Cylinder Fiber mat (2010) |
| 14. | 02 Middleton shifters |
| 15. | 07 Michie Shifters |
| 16. | 01 Chota Shifter |
| 17. | 02 Complete Suction Winnower |
| 18. | Complete Colours Separator - Senvec GTS600B |
| 19. | Complete Colours Separator Shizuoka - 22 years old |
| 20. | Complete Colours Separator - Timing CCD 2013 |
| 21. | Firewood Splitter (Chandana) 20 HP |
| 22. | Generator (UK) 100 KVA |

**ආර්. ඒ. පී. රාජපක්ෂ,**
සමාගම් ලේකම්.

දිනය : 2021, මැයි මස 24 වැනි දින.

12-398

---

**සෙලාන් බැන්ක් පීඑල්සී**

**(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.10.27 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව - ඇඹිලිපිටිය
ගිණුම් අංකය - 0450-32534800-001

සෙලාන් බැන්ක් පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම ලියාපදිංචි අංක පීකිව් 9) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අභයවර්ධන විසින් සහතික කරන ලද 2011 අගෝස්තු 19 දිනැති උකස් බැඳුම්කර අංක 5395, ප්‍රසිද්ධ නොතාරිස්

කේ. එච්. එම්. එම්. කේ. කාරියවසම් විසින් දෙකම සහතික කරන ලද 2012 ජුනි 28 දිනැති 84, 2012 සැප්තැම්බර් 26 දිනැති 100, ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ඩී. ජේ. ප්‍රේමරත්න විසින් සහතික කරන ලද 2015 පෙබරවාරි 11 දිනැති 172 සහ 173, ප්‍රසිද්ධ නොතාරිස් අයි. කේ. ඒ. කච්මිණි ගයන්තිකා විසින් සියල්ල සහතික කරන ලද සියල්ල 2017 ජූලි 17 දිනැති 14, 15 සහ 16, 2018 ඔක්තෝබර් 04 දිනැති 289 සහ 290 මත අයවිය යුතු මුදල් ගෙවීම, ඇඹිලිපිටිය පදිංචි ගයාන් දිල්රුක් රණවීර යන අය බන්ධනදායී/ උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් 2021 ජූලි 07 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙකෝටි විසිඅටලක්ෂ අනූදහස් හත්සිය හතලිස්තුනයි ශත හැටහය (රු. 22,890,743.66) මුළු මුදලක් සහ එකී බැඳුම්කර මත පහත සඳහන් කරනු ලබන පරිදි පහසුකම් මත පොළිය දැන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් දෙකෝටි විසිඅටලක්ෂ අනූදහස් හත්සිය හතලිස්තුනයි ශත හැටහය (රු. 22,890,743.66), 2021 ජූලි 08 දින සිට මුළු මුදල අයකර ගන්නා දිනය දක්වා පහත සඳහන් පරිදි පොළිය සමග, ප්‍රසිද්ධ කිරීමේ වියදම්, එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යම්කිසි වෙනත් ගාස්තු, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී උකස් බැඳුම්කර අංක 5395, 84, 100, 172, 173, 14, 15, 16, 289 සහ 290 මගින් සෙලාන් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(*අ*) එකී රු. 10,500,000.00ක ස්ථිර අයිරා අණකර 1 පහසුකම සම්බන්ධයෙන් 2021 ජූලි 07 දින වන විට රුපියල් එක්කෝටි හතලිස් හයලක්ෂ දහනවදහස් දෙසිය විසිදෙකයි ශත තිස්අටක (රු. 14,619,222.38) මුදලක් සහ 2021 ජූලි 08 දින සිට වසරකට සියයට විසි අට (28%) බැගින් පොළිය සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතු මුළු මුදල බව ප්‍රකාශ කිරීමට මට වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.

(*ආ*) එකී රුපියල් 7,500,000.00ක පරිභ්‍රමණීය කෙටිකාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2021 ජූලි 07 දින වන විට රුපියල් අසූදෙකලක්ෂ හැත්තෑඑක්දහස් පන්සිය විසිඑකයි ශත විසිඅටක (රු. 8,271,521.28) මුදලක් සහ රුපියල් හැටතුන්ලක්ෂ විසිපන්දහස් පන්සිය හතලිස් හයයි ශත හතරක (රු. 6,325,546.04) මුදලක් මත 2021 ජූලි 08 දින සිට වසරකට සියයට දහඅට (18%) බැගින් පොළිය සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතු මුළු මුදල බව ප්‍රකාශ කිරීමට මට වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.

### පළමු උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ අංක 216, තුන්කම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තුන්කම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2006.09.11 දිනැති අංක 2855 දරන සැලැස්මේ නිරූපණය වන කොන්තේනිස් වත්ත හි කොටස නමැති ඉඩමෙන් ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් බී ද, දකුණට : මාදම්පේ සිට නෝනාගමට යන ප්‍රධාන පාර සහ බස්නාහිරට : සියඹලා කඩේවත්ත ද, යන මායිම් තුළ පර්චස් දහතුනක් (අ.0, රූ.0, පර්.13) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. එම්. එම්. කේ. කාරියවසම් විසින් දෙකම සහතික කරන ලද 2012 ජුනි 28 දිනැති උකස් බැඳුම්කර අංක 84, 2012 සැප්තැම්බර් 26 දිනැති 100, ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ඩී. ජේ. ප්‍රේමරත්න විසින් සහතික කරන ලද 2015 පෙබරවාරි 11 දිනැති 172, ප්‍රසිද්ධ නොතාරිස් අයි. කේ. ඒ. කච්මිණි ගයන්තිකා විසින් සියල්ල සහතික කරන ලද දෙකම 2017 ජූලි 17 දිනැති 15 සහ 16 සහ 2018 ඔක්තෝබර් 04 දිනැති 290 යටතේ උකස් කරන ලද දේපළ.

### දෙවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ සහ ඇඹිලිපිටිය නගර සභා ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ පල්ලේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, ඇඹිලිපිටිය පල්ලේගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. ඒ. යූ. නවරත්න විසින් සාදන ලද 2011.07.19 දිනැති අංක 0329 දරන සැලැස්මේ නිරූපණය වන කිරලවැල්කටුව නින්දගම හි කොටස නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : මහා මාර්ගය සහ වෙන්කළ ඉඩම ද, දකුණට : කේ. එම්. ඩබ්ලිව්. චන්ද්‍රලාල් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. කේ. මනම්පේරි විසින් සාදන ලද 1998.12.27 දිනැති අංක 444 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද, යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම තුනක් (අ.0, රූ.0, පර්. 18.3) *නොහොත්* හෙක්. 0.0463ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අභයවර්ධන විසින් සහතික කරන ලද 2011 අගෝස්තු 19 දිනැති උකස් බැඳුම්කර අංක 5395, ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ඩී. ජේ. ප්‍රේමරත්න විසින් සහතික කරන ලද 2015 පෙබරවාරි 11 දිනැති 173, ප්‍රසිද්ධ නොතාරිස් අයි. කේ. ඒ. කව්මිණි ගයන්තිකා විසින් දෙකම සහතික කරන ලද 2017 ජූලි 17 දිනැති 14 සහ 2018 ඔක්තෝබර් 04 දිනැති 289 යටතේ උකස් කරන ලද දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
නීතිඥ.
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.
12-475

---

## අමානා බැන්ක් පී. එල්. සී. (PB 3618 PQ)

## (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරනලද ලියාපදිංචි අංක PB 3618 PQ යටතේ ලියාපදිංචි වී ඇති පොදු බැංකු සමාගමකි)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව 2021.11.20 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම සහ ඒකමතිකව පහත දැක්වෙන පරිදි යෝජනා සම්මත කරන ලදී. එනම්,

අලුත් වෙන්දේසිකරුවකු නම් කිරීම - මොහොමඩ් ඉස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහොමඩ්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ දෙහිවල බැංකු ශාඛාවේ ගණුදෙනුකරුවෙකු වන මොහොමඩ් ඉස්මත් මොහොමඩ් සිද්දික් නූර් මොහාමඩ් යන අය විසින් ඇපකරයක් වශයෙන් උකසට තබන ලද දේපළ සම්බන්ධයෙන් ප්‍රසිදධ වෙන්දේසි පැවැත්වීම සඳහා 2019.12.21 දින දරන යෝජනා සම්මත දෙකක් (02) මගින් බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන මහත්වරුන් සඳහා බලය පවරා තිබූ හෙයින් ද,

එම යෝජනා සම්මත අනුමත කිරීමෙන් පසුව, ෂොක්මන් සහ සමරවික්‍රම යන මහත්වරුන්ගේ එකී පත්කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති හෙයින් ද, 1990 අංක 4 දරන පනත යටතේ දේපළ වෙන්දේසි පැවැත්වීම සඳහා වෙනත් වෙන්දේසිකරුවකු පත්කර ගැනීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද,

දේපළ වෙන්දේසි පැවැත්වීම සඳහා සහ 1990 අංක 4 දරන පනත යටතේ අවශ්‍ය පියවර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා පත් කරනු ලබන බවට අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

ඉහත කී පත්කිරීම හැරෙන්නට, 2019.12.21 දින අමානා බැන්ක් පී.එල්.සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද සහ 2020.07.31 දින රජයේ *ගැසට්* පත්‍රයේ සහ 2020.07.31 දින ඩේලි මිර්ර, දිවයින සහ වීරකේසරී යන පුවත්පත්වල පළකරන ලද යෝජනා සම්මතවල අන්තර්ගත සෙසු කරුණු නොවෙනස්ව බලාත්මකව පැවතිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රීසා ඉස්මායිල් - අය කිරීම් කළමනාකරන ප්‍රධානී.

12-477

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.